## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2010

-------------------------------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශේෂ පත්‍රයේ ණයහිමියන් යටතේ පෙන්නුම්කර තිබූ "ඉල්ලම" රක්ෂණ අරමුදලේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ගිණුමේ පැවති පිළිවෙලින් රු.4,212,623 ක් සහ රු.6,126,285 ක ශේෂ සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබුණි. මෙය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාර ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.2 ගණකාධිකරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රත්නපුර නව ගොඩනැගිල්ලේ වෙළඳකුටි බාහිර ආයතන වෙත කුලියට දීමෙන් ලැබිය යුතු රු.3,187,000 ක්, ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2007, 2008 හා 2009 වර්ෂ සඳහා ඉදිරිපත් කර ඇති බිල්පත් අනුව එකී වර්ෂ සඳහා නොගෙවූ විගණන ගාස්තු එකතුව රු.1,416,620 ක් වුවත්, උපචිත විගණන ගාස්තු වශයෙන් රු.2,441,077 ක් දක්වා තිබුණි.

(ඇ) රාජසන්තක කළ ඇප මුදල් ගිණුම රු.100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රවර්ධන අයිතමයක් ලෙස 2010 දෙසැම්බර් මස ලබා ගන්නා ලද ආභරණ පෙට්ටි 14 ක් වෙනුවෙන් ගෙවීමට නියමිතව තිබූ රු.357,500 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ණය ගැති ශේෂය තුළ තිබෙන රු.163,949 ක් වූ ආපසු එවූ චෙක්පත්වලින් රු.29,436 ක් වටිනා චෙක්පත් 6 ක් වසර 3 සිට වසර 8 දක්වා කාලයක සිට පැවත එන අතර, රු.64,114 ක් වටිනා චෙක්පත් 8 ක් වසර 01 සිට වසර 3 දක්වා කාලයක සිට පැවතුණි.

(ආ) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයෙන් ලැබිය යුතු රු.9,786,537 ක මුදල තුළ වසර 5 ට වඩා පැරණි රු.4,898,232 ක ශේෂයක් වූ අතර, අවුරුදු 2 සිට 5 දක්වා පැරණි ශේෂය රු.4,521,304 ක් විය.

(ඇ) විවිධ ණයගැති ශේෂයේ ඇතුළත් රු.57,407 ක ආපදා ණය මුදලක්ද, බෙලිදෙණිය ගොඩනැගිල්ලෙන් ලැබිය යුතු කුලී රු.20,500 ක්ද, රු.9,025 ක ලැබිය යුතු රක්ෂණ මුදලක්ද සමඟ මුළු එකතුව රු.86,932 ක මුදල වසර 8 ක් ඉක්මවා ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙක තුළදී ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපිත වෙළඳ කුටි කුලියට දීම වෙනුවෙන් එකතුව රු.4,975,285 ක මුදලක් උපබදු ලබා දී ඇති පුද්ගලයින්ගෙන් අධිකාරිය අයකර නොතිබුණි.

(ඉ) එකතුව රු.3,515,043 ක් වූ ණය හිමි ශේෂ 4 ක් වසර 5 කට වැඩි කාලයක සිට පැවත එන අතර, සමාලෝචිත වර්ෂයේදීද එම අගයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

රු.185,000 ක ඇප මුදල් ආපසු ගෙවීමට අදාල මුදල් තැන්පතු කුවිතාන්සි හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය, රු.20,000 ක ඡායාරූප ගාස්තු ගෙවීමට අදාල ඇල්බමය හා සීඩී, රු.3,094,808 ක නිවාස ණය යෝජනා ක්‍රමයට අදාල අධිකාරය හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග එළඹි ගිවිසුම, වෙළඳ ප්‍රදර්ශනය සඳහා රූපවාහිනී හා පුවත්පත් දැන්වීම් පළ කිරීමට දරන ලද රු.1,965,330 ක වියදම්වලට අදාල ලිපිගොනුව සහ රු.232,100,125 ක් වූ සථාවර වත්කම් සම්බන්ධ සමීක්ෂණ මණ්ඩල වාර්තා නොමැති වීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළි ගැනීමට හෝ නොහැකි විය.

## 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 5.2.1 සහ 5.2.5 වගන්ති | වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ක්‍රියාකාරී සැලැස්මද ඇතුළත් විය යුතු බවත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අයවැය ලේඛනය අදාල අමාත්‍යාංශය, භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2010 වර්ෂයේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1995 නොවැම්බර් 20 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 105 | ප්‍රදාන හා තෑගි භාණ්ඩ සඳහා පෙර වර්ෂයේ බදු පස ලාභයෙන් 1% ක් දක්වා කැබිනට් අනුමැතිය මත වැයකළ හැකි බව දැක්වෙතත් ඉකුත් වර්ෂයේ අලාභයක් පැවතියදීත් අනමැතියකින් තොරව රු.2,036,464 ක තිළිණ ප්‍රදානයක් සිදු කර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2009 නොවැම්බර් 20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 440 සහ මිලදී ගැනීම් මාර්ගෝපදේශ සංග්‍රහය | අධිකාරිය විසින් සමරු තිළිණ, ආභරණ පෙට්ටි සහ මැණික් ගල් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,061,350 ක් වැය කර තිබූ අතර, මෙම මිලදී ගැනීම් සඳහා දෙපාර්තමේන්තු මිලදී ගැනීම් කමිටුවක හා ඇගයීම් කමිටුවක නිර්දේශ අවශ්‍ය වුවද, ඊට පටහැනිව විවෘත මිල කැඳවීමක්ද නොකර, මිලදී ගැනීම් සිදු කර තිබුණි. අමාත්‍යාංශයේ අවශ්‍යතාවය සඳහා මෙම මිලදී ගැනීම් සිදු කර ඇති බව 2011 මැයි 13 දින සභාපතිවරයා විසින් එවන ලද ලිපියේ දක්වා තිබුණි. |
| (ඈ) 2008 ජූලි 28 දිනැති රාජ්‍ය ව්‍යාපාර අංක පීඊඩී/50 චක්‍රලේඛය | 2010 මැයි, ජූනි, ජූලි මාස සඳහා නිල වාහන 05 ක් සඳහා අනුමත සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 1505.99 ක් වෙනුවෙන් රු.165,079 ක මුදලක් වැය කර තිබුණු අතර, විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. |
| (ඉ) මිලදී ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| (i) 2.14.1 ජේදය | ජාත්‍යන්තර තත්ත්වයේ වෙළඳ ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන පුවරු සවි කිරීමට රු.2,355,074 ක් වැය දැරීමේදී මිලදී ගැනීමේ කමිටුවට විෂය සම්බන්ධ දැනුමක් ඇති නිලධාරියෙකු පත්කර නොතිබුණි. මෙය ජුවෙල්ස් ශ්‍රී ලංකා සංවිධායක මණ්ඩලය විසින් යෝජනා කොට අනුමත කරන ලද බව 2011 මැයි 13 දන සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පිළිතුරු ලිපියේ දක්වා තිබුණි. |
| (ii) 6.2.2 වගන්තිය | (අ) වෙළඳ ප්‍රදර්ශනයේ කාර්යයන් කළමනාකරණය සඳහා ආයතනයක් තොරා ගැනීමට විවෘත මිල කැඳවීමක් සිදු කිරීමේදී මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 21 ක කාලයක් ලබා දිය යුතු වුවත්, දින 03 ක කෙටි කාලයක් ලබා දී තිබුණි. |

(ආ) ඉහත කාර්යය සඳහා ඉදිරිපත් වූ මිල ගණන් අතරින් රු.6,739,500 (බදු රහිත) අවම මිල මෙන් දෙගුණයකට ආසන්න රු.12,381,500 (බදු රහිත) මිල තෝරා ගැනීමට පාදක වූ හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

| | |
|---|---|
| (iii) 5.4.4 (i) වගන්තිය | අත්තිකාරම් වශයෙන් ලබා දිය හැක්කේ 20% ක් වුවත්, වෙළඳ ප්‍රදර්ශනය සඳහා කළමනාකරණ කාර්යය ලබා ගැනීමේදී 20% ක් 30% ක් වශයෙන් අවස්ථා දෙකකදී අත්තිකාරම් ගෙවීමට ගිවිසුම්ගත වී තිබුණු අතර, මුළු වටිනාකමින් 43% ක් හෙවත් රු.6,079,587 ක් ඒ සඳහා ගෙවා තිබුණි. |
| (iv) 4.3.1 (ඇ) වගන්තිය | හදිසි අවිනිශ්චිත අවස්ථා සඳහා ඉඩදිය හැක්කේ මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් 10% ක් පමණක් වුවත් වෙළඳ ප්‍රදර්ශනයේ මුළු පිරිවැයෙන් 49% ක් දක්වා අතිරේක වියදම් සඳහා අනුමැතිය ලබාගෙන තිබුණු අතර, රු.4,862,500 ක් එනම්, මුළු පිරිවැයෙන් 39% ක ප්‍රමාණයක් ගෙවා තිබුණි. |
| (v) 5.4.8 වගන්තිය | කොන්ත්‍රාත්තුව හෝ කාර්යයෙහි මුළු පිරිවැයෙන් 5% කට නොඅඩු ප්‍රමාණයකට කාර්ය සාධන ඇපකරයක් ලබාගත යුතු වුවත්, වෙළඳ ප්‍රදර්ශනය සඳහා කළමනාකරණ කාර්යය වෙනුවෙන් ඒ අනුව ඇපකරයක් ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු.32,966,486 ක ශුද්ධ අලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ අලාභය රු.11,498,187 ක් විය. ඉඩම් වෙන්දේසි ආදායම රු.31,409,598 කින් අඩුවීම, ආයතනික වියදම රු.15,458,117 කින් සහ ප්‍රවර්ධන වියදම රු.15,764,568 කින් වැඩි වීම ශුද්ධ අලාභය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

#### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙකක අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලයන්හි බදුවලට පෙර තත්ත්වය පහත පරිදි විය.

| වර්ෂය | ලාභය / (අලාභය) |
|---|---|
| | රු. |
| 2008 | 29,407,730 |
| 2009 | (11,498,187) |
| 2010 | (32,966,486) |

මේ අනුව, 2009 වර්ෂයේ මිලියන 40 කින්ද, 2010 වර්ෂයේ මිලියන 21 කින්ද අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලවල පිරිහීමක් නිරීක්ෂණය වන අතර, ලාභය වැඩි කිරීමට / අලාභය අවම කර ගැනීමට අවධානය යොමු විය යුතු වේ.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

#### 2.2.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) බලපත්‍ර නිකුත් කිරීම

-----------------------

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි ප්‍රාදේශීය ඒකක හා කොළඹ පිහිටි කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ

ඇැස්තමේන්තුගත ඉලක්කය කරා ළඟා වීමේ ප්‍රතිශතය මැණික් ගැරීම් බලපත්‍ර 67% ක්ද, වෙළඳ බලපත්‍ර 74% ක්ද, මැණික් කැපීමේ බලපත්‍ර 60%ක්ද, මැණික් වෙන්දේසි බලපත්‍ර නිකුත් කිරීම 37% ක්ද වීම.

(ආ) ව්‍යවස්ථාපිත ක්‍රියාකාරකම් මත ආදායම්

---------------------------------------------

ඉකුත් වර්ෂ 2 ක හා සමාලෝචිත වර්ෂයේ ව්‍යවස්ථාපිත ක්‍රියාකාරකම් පහත පරිදි විය.

| | 2008 | 2009 | 2010 |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම් | 0.4 | 40.6 | - |
| ඉඩම් පතිසංස්කරණ කොමිෂන් සභාව සහ වතු සමාගම් | 54.5 | 8.2 | 17.5 |
| මැණික් ගැරීමේ බලපත්‍ර | 8.5 | 7.7 | 19.1 |
| වෙළඳ බලපත්‍ර | 21.3 | 18.6 | 20.7 |
| අපනයන මත කොමිස් | 62.7 | 42.4 | 47.3 |
| මැණික් කැපීමේ බලපත්‍ර | 0.3 | 0.2 | 0.2 |
| ගෙවුඩ අපනයන කොමිස් | 7.5 | 5.8 | 5.5 |
| ඛණිජ බදු | 1.7 | 2.4 | 2.8 |
| | 156.9 | 125.9 | 113.1 |

මේ අනුව,

(i) 2008 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ව්‍යවස්ථාපිත ක්‍රියාකාරකම් මත ආදායම 28 % කින් අඩු වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී වැටලීම් සම්බන්ධයෙන් රු.1,469,836 ක් වැය කර තිබියදී සහ මැණික් ගැරීම් හා වෙළඳ බලපත්‍ර ගාස්තු 50 % කින් වැඩි කර තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී ව්‍යවස්ථාපිත ක්‍රියාකාරකම් ආදායම සැලකිය යුතු අගයකින් අඩු වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී රජයේ ඉඩම් වෙන්දේසි සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා වතු සමාගම සතු ඉඩම් වෙන්දේසි 888 ක් පැවැත්වීමට ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඉඩම් වෙන්දේසි සිදු කර තිබුණේ 112 ක් හෙවත් ඇස්තමේන්තු අගයෙන් 12 % ක් පමණි.

(ඇ) මැණික් හා ස්වර්ණාභරණ අපනයන

ඉකුත් වර්ෂ 4 ක් සමඟ සැසඳීමේදී අපනයන පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

රු.මිලියන

| | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|---|
| මැණික් අපනයන | 9,853 | 10,444 | 8,281 | 7,226 | 7,488 |
| ස්වර්ණාභරණ අපනයන | 1,751 | 2,076 | 1,728 | 1,523 | 1,490 |
| එකතුව | 11,604 | 12,520 | 10,009 | 8,749 | 8,978 |
| අපනයන ප්‍රවර්ධනය කිරීමේ වියදම (දේශීය / විදේශීය ) | 17 | 42 | 35 | 33 | 49 |
| අපනයන වැඩිවීමේ ප්‍රතිශතය (ඉකුත් වර්ෂ සමඟ) | | 7 % | (25 %) | (14 %) | 3 % |

(i) මැණික් අපනයන 2007 වර්ෂයට සාපේක්ෂව 2008,2009 සහ 2010 වර්ෂවල පිළිවෙලින් 21 % කින්, 31 %කින් සහ 28 % කින් පහත බැස තිබුණි.

(ii) ස්වර්ණාභරණ අපනයන 2007 වර්ෂයට සාපේක්ෂව 2008,2009 සහ 2010 වර්ෂලදී පිළිවෙලින් 16.76 % , 26.63 % ක් සහ 28.22 % කින් පහත බැස තිබුණි.

(iii) අපනයන ප්‍රවර්ධන පිරිවැයට සාපේක්ෂව අපනයන වල වර්ධනයක් පෙන්නම් නොකෙරුණි.

(ඇ) විදේශ වෙළඳ ප්‍රදර්ශන - 2010

---------------------------------

(i) 2010 වර්ෂයේ අපනයන ප්‍රවර්ධන සැලැස්ම අනුව සහභාගී වීමට නියමිතව තිබූ විදේශ වෙළඳ ප්‍රදර්ශන 9 කින් 5 කට පමණක් සහභාගී වී තිබුණි.

(ii) 2010 වර්ෂය තුළදී පවත්වන ලද විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා ඇස්තමේන්තු ඉක්මවා වියදම් දරා තිබුණු අවස්ථා පහත පරිදි විය.

| වෙළඳ ප්‍රදර්ශනය | ඇස්තමේන්තු කළ වියදම | සත්‍ය වියදම | වෙනස |
|---|---|---|---|
| | රු | රු. | රු. |
| ජුවලර් ෂැංහයි ප්‍රදර්ශනය | 1,887,356 | 4,866,539 | 2,979,183 |
| චයිනා ඉන්ටර්නැෂනල් ගෝල්ඩ් ජුවලර් ඇන්ඩ් ජෙම් ෆෙයා | 1,040,331 | 2,749,475 | 1,709,144 |
| සිංගප්පූරු ජාත්‍යන්තර ජුවලර් ප්‍රදර්ශනය | 1,579,993 | 2,024,473 | 444,480 |
| චීන ජාත්‍යන්තර ආභරණ ප්‍රදර්ශනය (බීජිං) | 2,119,413 | 5,092,353 | 2,972,940 |

(ඉ) සමාලෝචිත වර්ෂයේ වැටලීම් 1155 ක් සිදු කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, වැටලීම් 584 ක් පමණක් සිදු කර තිබුණි. එමගින් ලද ආදායම රු.11,554,417 ක් විය.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ඉඩම් කැණීම් හා තාක්ෂණ අංශයේ කාර්යභාරයන් සඳහා කැබ් රථයක අවශ්‍යතාවය පෙන්නුම් කරමින් රු.9,700,000 කට කැබ් රථයක් මිලදී ගෙන තිබූ අතර, මෙය අදාල කාර්යය සඳහා භාවිතා නොකර ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ නිල වාහනය ලෙස යොදා ගෙන තිබුණි.

(ආ) තත්ත්ව රසායනාගාරයක් පිහිටුවීම සඳහා 2001 වසරේ සිට 2005 වසර දක්වා අපනයන ආදායමින් අයකර ගත් රු.99,545,573 ක මුදලින් අරමුදලක් පිහිටුවා තිබුණි. මෙම අරමුදලින් රු.7,046,995 ක මුදලක් තත්ත්ව සහතික නිකුත් කිරීමේ පහසුකම් සැපයීමට එකඟ වූ ඇමරිකානු මැණික් වෙළඳ සමාගමකට ගෙවා තිබුණද,

ඉන් කිසිදු ප්‍රයෝජනයක් සිදු වී නොතිබුණි. රසායනාගාරය ඉදි කිරීම සඳහා 2009 අප්‍රේල් වන තෙක්ම අවශ්‍ය පියවර ගෙන නොතිබූ අතර, 2009 අප්‍රේල් මාසයේදී එම අරමුදලේ රු.92,498,578 ක ඉතිරි මුදල අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පෞද්ගලික ආයතනයකට එම කාර්යය ඉටු කිරීම සඳහා ලබා දී තිබුණි. එසේ වුවත්, අධිකාරිය විසින් එම සමාගමේ ඇබෑර්තු දෙකක් පිරවීම සඳහා රු.26,208 ක වියදමක් දරා පුවත්පත් දැන්වීමක්ද පළ කර තිබුණි.

(ඇ) වෙළඳ ප්‍රදර්ශන සඳහා මිලදී ගෙන තිබුණු රු.1,760,000 ක් වටිනා Name Board, Special Gem display area, Information desk with two spot light, entrance branding, display structure boxes යන අයිතම් වර්ග වෙළඳ ප්‍රදර්ශනය අවසන් වීමෙන් මාස 05 ක් ගතවීමෙන් පසුද අධිකාරි පරිශ්‍රයේ නොවූ අතර, මෙම වත්කම් පෞද්ගලික ස්ථානයක ගබඩා කර ඇති බව ලිඛිතව දැනුම් දී තිබුණි. මෙම වත්කම් අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනයටද ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 1998 ජනවාරි 01 දින සිට "ඉල්ලම" නමින් මැණික් පතල් කම්කරුවන් සඳහා වූ සමාජ රක්ෂණ ක්‍රමයක් වෙනුවෙන් සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මෙම රක්ෂණ ක්‍රමය සඳහා මැණික් පතල් කම්කරුවන්ගෙන් වසරකට රු.120 බැගින් වාරික අයකර තිබුණි. 2000 වර්ෂයේ සිට මෙම රක්ෂණ ක්‍රමය අක්‍රීයව තිබූ අතර, 2010 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම ගිණුමේ ශේෂය විවිධ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර තිබුණි.

### 2.2.3 ආර්ථිකමය නොවූ ගනුදෙනු

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා ආයතනයේ දායකත්වය රු.4,000,000 ක් වූ අතර, නිලධාරීන්ගේ දායකත්වය රු.236,550 ක් විය. මේ අනුව වෛද්‍යාධාර මුළු මුදලින් 6% ක දායකත්වය නිලධාරීන්ගෙන් වූ අතර, ආයතනයේ දායකත්වය 94% ක ඉහළ අගයක් ගැනුණි. වර්ෂය තුළ වෛද්‍යාධාර ගෙවීම්, මුළු දායක මුදලින් 99.9 ක් විය.

(ආ) අධිකාරිය සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමඟ එළඹි ගිවිසුම අනුව නිවාස ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වී තිබූ අතර, එමගින් නිවාස ණය ලබාගෙන තිබූ නිලධාරීන් විසින් 2010 දෙසැම්බර් 31 දින වන විට සියළුම ණය පියවා තිබුණි. එසේ වුවද, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් රු.3,094,808 ක මුදලක් අධිකාරියට ලැබීමට තිබූ අතර, මෙම මුදල සඳහා 5% කට ආසන්න ප්‍රමාණයක පොළී මුදලක් අධිකාරියට ලැබෙන අතර, මෙම මුදල නිරවුල් කර වෙනත් ඵලදායී හෝ ආර්ථිකමය කාර්යකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.2.4 ව්‍යාතිරේඛ වියදම්

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත "නිදහස" සංස්කෘතික උත්සවයේ මැණික් ගලක ආකෘතියට සකසන ලද ප්‍රදර්ශන කුටිය ඉදි කිරීම සඳහා රු. මිලියන 6.5 ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර, මේ සඳහා රු.2,000,000 ක අත්තිකාරම් මුදලක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි.

(ආ) අධිකාරිය විසින් පුහුණු පාඨමාලා පැවැත්වීමක් සිදු නොකරනු ලබන අතර, ඒ සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවා තිබියදීත් ශ්‍රී ලංකා දියමන්ති නිෂ්පාදකයින්ගේ සංගමය සමඟ එකතුව දියමන්ති කැපීම හා ඔප දැමීම පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම පිළිබඳ පුවත්පත් දැන්වීමක් පළ කිරීම සඳහා රු.1,166,704 ක මුදලක් වැයකර තිබුණි.

## 2.2.5 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 2011 වසර සඳහා වූ අපනයන ප්‍රවර්ධන හා අලෙවිකරණ සැලැස්ම විදේශ තානාපතිවරුන්ට හඳුන්වා දීම සඳහා වූ සුහද හමුව සඳහා රු.2,063,008 ක වියදමක් දරා තිබුණු අතර, මෙම වැඩසටහන සඳහා අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලබාගෙන නොතිබුණි.

(ආ) දෛනික ධාවන සටහන් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී වාහන 4 ක් සම්බන්ධයෙන් වාහන ධාවනයෙන් පසු දිනය අවසානයේදී තිබිය යුතු ඉන්ධන ප්‍රමාණය රු.36,385 ක් වටිනා ලීටර් 466.04 ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර, වාහන 3 ක් සම්බන්ධයෙන් ඉන්ධන ටැංකියේ ධාරිතාවය ඉක්මවා ඉන්ධන ලීටර් 310.5 ක් ගැසීම වෙනුවෙන් රු.23,960 ක් වැය කර තිබුණි.

(ඇ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක MF6/1/1/96 චක්‍රලේඛයේ 2.2.1 (vi) ඡේදය අනුව ලැගුම් හා යැපීම් දීමනා ලබා ගැනීමේදී ඒ ඒ නිලධාරීන් සඳහා හිමිකම ඇති බණ්ඩිත රේට් ගණනට / ඒකාබද්ධ රේට් ගණනට වඩා වැඩිපුර මුදල් ලබා ගෙන තිබූ අතර, සංචාරයෙන් පසු පියවන ලද මුදලද සැලකිල්ලට ගැනීමෙන් පසු එසේ වැඩිපුර ලබාගෙන ඇති මුදලින් නිලධාරීන් 4 දෙනෙකුගෙන් අධිකාරියට අය වීමට ඇති මුදල ඇමරිකානු ඩොලර් 1391.9 ක් විය.

(ඇ) ඉහත (ඈ) හි සඳහන් චක්‍රලේඛ ප්‍රකාරව ලැගුම් හා යැපීම් දීමනා සහ අනියම් වියදම්වලට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිලධාරින් 5 දෙනෙකු සඳහා හදිසි වියදම් වශයෙන් ඩොලර් 4000 ක් භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ගෙවා තිබූ අතර, මෙම මුදල්වලින් අනියම් වියදම් වශයෙන් දැරිය යුතු දුරකථන බිල්පත් හා ටැක්සි ගාස්තුද දරා තිබුණු අතර, ඉතිරි මුදල වූ ඇමරිකානු ඩොලර් 1765.50 ක් ආපසු අධිකාරියට ගෙවා තිබුණි.

## 2.2.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් නිරීක්ෂණය විය.

(අ) ඉහළ කුලී ආදායමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් 2006 වර්ෂයේ මිලදී ගන්නා ලද මොණරාගල ගොඩනැගිල්ලේ 2010 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වටිනාකම රු.15,461,013 ක් විය. මෙම ගොඩනැගිල්ල සඳහා වාර්ෂික ක්ෂය ප්‍රතිපාදනය රු.309,220 ක් ලාභයට එරෙහිව කපා හරිනු ලබන අතර, මෙය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම හැර වෙනත් ඵලදායී කටයුත්තකට යොදාගෙන නොතිබුණි.

(ආ) රත්නපුර නව නගරයේ රු.26,127,617 ක පිරිවැයක් දරා ඉදි කරන ලද ගොඩනැගිල්ල රජය කළ ඉල්ලීම මත සබරගමුව පළාත් සභාව වෙත පවරා තිබුණු බව සභාපතිවරයා විසින් දන්වා ඇතත් අධිකාරිය විසින් මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය ලෙස රු.522,552 ක් ආදායමට එරෙහිව කපා හරිනු ලබයි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට රු.5,358,501 ක් වටිනා බෙලිදෙණියේ ගොඩනැගිල්ල කිසිදු ඵලදායී කාර්යයකට යොදාගෙන නොතිබුණි. මෙම ගොඩනැගිල්ල පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම සඳහා මුදල් අය කිරීමකින් තොරව 2010 ජනවාරි 05 දින සිට වෘත්තීය පුහුණු අධිකාරිය වෙත ලබා දීමට බදු ගිවිසුමකට එළඹ තිබුණ නමුත්, 2010 සැප්තැම්බර් 01 දින වනවිටත් කිසිදු පාඨමාලාවක් පවත්වා නොතිබූ අතර, ගොඩනැගිලි පරිශ්‍රය වල් බිහිවී ගොස් තිබුණ බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. 2011 මැයි 13 දිනැති සභාපතිවරයාගේ පිළිතුරු අනුව මැණික් කැපීම හා ඔප දැමීම සඳහා 30 දෙනෙකු පුහුණුව ලබන බව සඳහන් කර තිබුණි.

(ඈ) මාතර ප්‍රාදේශය කාර්යාලයේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව හා කාර්යාල සඳහා අවශ්‍ය වන ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹීමකින් තොරව මාසික කුලිය රු.28,000 බැගින් දෙමහල් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබූ අතර, එහි පළමු මහල සම්පූර්ණයෙන්මද බිම් මහලේ කාමර 01 ක්ද ප්‍රයෝජනයට ගෙන නොතබුණි.

(ඉ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳ කුටි 09 ක් කුලියට දීමකින් තොරව පැවති අතර, සමාලෝචිත වර්ෂයේදී එමගින් අධිකාරියට සිදු වී ඇති පාඩුව රු.7,441,649 ක් විය.

(ඊ) ස්ථාවර වත්කම් යටතේ කෙරෙමින් පවතින වැඩ (working progress) සම්බන්ධයෙන් 2001 සිට 2005 දක්වා කාලය තුළ රු.1,475,441 ක් වැය දරා තිබුණි. මේ සම්බන්ධයෙන් කිසියම් වූ ඵලදායී වැඩි දියුණු කිරීමේ කාර්යයක් පසුගිය වර්ෂ 5 තුළදීම සිදු කර නොතිබූ අතර, අදාල ව්‍යාපෘතියේ කටයුතු අත්හැර දමා තිබුණි.

### 2.2.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්

----------------------------------------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් 1997 ජනවාරි 24 නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 116 අනුව රාජ්‍ය ව්‍යවසායන්ට අයත් සම්පත් අමාත්‍යාංශය විසින් උපයෝජනයට ගැනීම නොකළ යුතු බව දන්වා තිබියදීත්, අධිකාරිය සතු වාහන 03 ක් වෙනුවෙන් රු.539,117 ක්ද, විදේශ සංචාර සඳහා රු.748,194 ක් සහ අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද සේවකයින් 4 දෙනෙකු වෙනුවෙන් වැටුප්, අතිකාල හා ප්‍රසාද දීමනා වෙනුවෙන් රු.341,277 ක් ද ගෙවා තිබුණි.

### 2.2.8 හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බදු දී තිබුණ බෙලිදෙණිය ගොඩනැගිල්ලෙ රු.6,655 ක ජල ගාස්තු මුදල හා විදුලිය බිල්පත් නොගෙවීම නිසා අදාල ජල හා විදුලි සම්බන්ධතාවයන් නැවත ලබා ගැනීම සඳහා පිළිවෙලින් රු.11,760 ක් හා රු.43,375 ක් ගෙවා තිබුණි.

(ආ) 2011 වසර සඳහා වූ අපනයන ප්‍රවර්ධන හා අලෙවිකරණ සැලැස්ම විදේශ තානාපතිවරුන්ට හඳුන්වා දීම සඳහා වූ සුහද හමුව සඳහා රු.72,100 කට ආරාධනා පත්‍ර 300 ක් මුද්‍රණය කර තිබූ අතර, 188 දෙනෙකුට පමණක් ආරාධනා පත්‍ර යවා තිබුණි. රු.26,317 ක් වටිනා ආරාධනා පත්‍ර 112 ක් වැඩිපුර මුද්‍රණය කර තිබුණි.

(ඇ) වෙළඳ ප්‍රදර්ශනය සඳහා Hoarding Diamond කිරීම සඳහා පෞද්ගලික ආයතනයකින් ස්පොට් ලයිට් 54 ක් සහ හැලජන් ලයිට් 18 ක් ලබාගෙන තිබුණු අතර, භෞතික පරීක්ෂාවේදී රු.26,500 ක් වටිනා හැලජන් ලයිට් 02 කඳ, බ්‍රැකට් ටයිම 01 කඳ ඌනතාවයක් විය. මිලදී ගෙන තිබූ මෙම උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛනයටද ඇතුළත් කර නොතිබුණි. 2011 ජුනි 02 දින ඉහත සඳහන් රු.369,000 ක් වටිනා ස්පොට් ලයිට් 27 ක් විගණනයට ඉදිරිපත් කරන ලදී.

(ඈ) සේවක භාරකාර අරමුදල් නියමිත දින නොගෙවීම නිසා 50% ක් එනම්, රු.10,350 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

(ඉ) 2010 ඔක්තෝබර් 9 - 15 කාලය තුළදී රුශ්‍යාලයේ පැවැත්වීමට නියමිතව තිබූ Hall Marking Convention රැස්වීමකට සහභාගී වීම වෙනුවෙන් ගුවන් ටිකට්පත් හා වීසා ලබා ගැනීම සඳහා රු.107,570 ක් වැයකර තිබූ නමුත්, අදාල රැස්වීම සඳහා සහභාගී වී නොතිබුණි.

### 2.2.9 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) අධිකාරිය සඳහා අනුමත සේවක සංඛ්‍යාව, ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගෙන තිබූ සංඛ්‍යාව හා සැසඳීමේදී පුරප්පාඩු පවතින බව අනාවරණය විය.

| වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| මාණ්ඩලික | 54 | 30 | 24 |
| මාණ්ඩලික නොවන | 167 | 95 | 72 |
| ප්‍රාථමික | 51 | 41 | 10 |
| කොන්ත්‍රාත් | - | 45 | - |
| අනියම් | - | 35 | - |
| තාවකාලික හා වෙනත් | - | 04 | - |
| | 272 | 250 | 106 |

(ආ) 2003 ජූන 02 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 (iv) හා (vii) ඡේද ප්‍රකාරව පුරප්පාඩු වූ තනතුරු සඳහා වැඩ බැලීමේ / රාජකාරී ඉටු කිරීමේ පත්වීම් මාස 03 කට වැඩි කාලයක් නොකළ යුතු බව දක්වා තිබියදීත් අධිකාරිය විසින් පුරප්පාඩු වූ තනතුරු සඳහා ස්ථිර පත්වීම් ලබා දීමකින් තොරව මාස 04 සිට මාස 12 ක් දක්වා කාලයක් සඳහා වැඩ බැලීමේ / රාජකාරී ඉටු කිරීමේ පත්වීම් ලබා දී තිබූ අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී තනතුරු 12 ක් වෙනුවෙන් ගෙවා ඇති මුදල රු.593,184 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී තනතුරු 9 ක් වෙනුවෙන් රු.727,105 ක් ගෙවා තිබුණි.

(ඇ) පුරප්පාඩු වූ තනතුරු පිරවීම සඳහා කොන්ත්‍රාත් අනියම් හා තාවකාලික වශයෙන් නිලධාරීන් 84 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ සේවකයින් 30 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) පඊඩී/12 චක්‍රලේඛයේ 9.3.1 (viii) අනුව කළමනාකරණ තනතුරක ඇතිවන පුරප්පාඩු පිරවීම අනුප්‍රාප්තික සැලැස්මකට (Succession Plan) අනුව කළ යුතුය . නමුත් ආයතනයට එවැනි සැලැස්මක් නොමැති වීම හේතුවෙන් , පුරප්පාඩු වන තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත් කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද නිලධාරීන් 6/2006 චක්‍රලේඛයට පටහැනිව මූලික වැටුප් තලයට වඩා වැඩි වැටුප් තලයක පිහිටුවීම හේතුවෙන් නිලධාරීන් 15 දෙනෙකු (හඳුනා ගන්නා ලද) වෙනුවෙන් රු.156,400 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරක් වන ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සඳහා 2010 මැයි 31 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්කළ සාමාජිකයෙක් පත්කර තිබූ අතර, ඔහු පූර්ණ කාලීනව සේවයේ නොයෙදී සිටියදීත් ඒ සඳහා පූර්ණ කාලීන විධායක අධ්‍යක්ෂවරයෙකුට මාසිකව ගෙවනු ලබන රු.20,000 ක දීමනාව සහ රු.10,950 ක මාසික ඉන්ධන දීමනාවක් ඇතුළුව එකතුව රු.216,650 ක් ගෙවා තිබුණි.

### 2.2.10 සංයුක්ත සැලැස්ම

--------------------

2006 - 2010 සංයුක්ත සැලැස්මට ඇතුළත් වූ මැණික් හා ස්වරණාභරණ කර්මාන්තයේ සංවර්ධනයට අදාල ඉලක්කයන් සපුරා ගැනීමට අධිකාරිය අපොහොසත් වීම නිසා එම ඉලක්කයන්ම 2009 - 2013 සංයුක්ත සැලැස්මට ඇතුළත් කර තිබුණි. 2009 - 2013 සංයුක්ත සැලැස්ම අනුව 2010 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් පැහැදිලිව නිරූපණය වනසේ වර්ෂයේ අයවැය ලේඛණය පිළියෙල කර නොතිබුණි.

### 2.2.11 අයවැය පාලනය

------------------

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර 21% සිට 74% දක්වා වූ සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලද. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) බදු ගෙවීම
(ආ) ඇප මුදල් ආපසු ගෙවීම
(ඇ) වාහන උපයෝජනය
(ඈ) බඳවා ගැනීම්
(ඉ) තොග පාලනය
(ඊ) ලැබිය යුතු ගිණුම්
(උ) අත්තිකාරම් ගෙවීම
(ඌ) ජර්නල් වවුචර් පිළියෙල කිරීම
(එ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය